**<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - විවෘත 2024</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.09.18 දිනැතිව ඔබ වෙත යොමු කරන ලද නිවේදනයට වැඩිමනත් වශයෙනි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/16/8/10/2024 හා 2025.09.18 දිනැති විධිමත් පත්වීම් ලිපිය මේ වන විටත් ලියාපදිංචි තැපෑලෙන් ඔබ වෙත යොමු කර ඇත. (ආදර්ශ පත්වීම් ලිපියේ පිටපතක් අමුණා ඇත.)

03. තවද, 2025.09.18 දිනැති නිවේදනයේ 03 වන ඡේදයේ සඳහන් ලිපි ලේඛන වලට අමතරව 2025.10.01 දින සේවාරම්භක පුහුණුවට පැමිණෙන අවස්ථාවේදී, ඔබ විසින් විධිමත් පත්වීම් ලිපියේ 19 වන ඡේදයේ අනු අංක ii, iii සහ iv හි සඳහන් ලිපි ලේඛනයන්හි මුල් පිටපත් සහ ඔබ විසින්ම සහතික කරන ලද ඡායා පිටපත් කට්ටලයක් රැගෙන ආ යුතුය.

04. සේවාරම්භක පුහුණු වැඩසටහනේ තොරතුරු

- කාල සීමාව - 2025 ඔක්තෝබර් මස 01 දින සිට 31 දින දක්වා
- සේවාරම්භක පුහුණුව
  - I කොටස - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී
  - II කොටස - විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ අවබෝධය (කොළඹ ආශ්‍රිත විවිධ ආයතනයන්හිදී )
- පුහුණු වැඩසටහන් පැවැත්වෙන සෑම දිනයක් සඳහාම අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුය.

05. පුහුණු වැඩසටහන සඳහා නියමිත ඇඳුම

a) පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වන පිරිමි නිලධාරීන් ජාතික ඇඳුමෙන් හෝ ලා පැහැති අත් දිග කමිසය හා දිග කලිසම, සුදුසු සපත්තු හා ටයි පටියකින් සැරසී සිටිය යුතුය.

b) පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වන කාන්තා නිලධාරිනියන් ලා පැහැති ඔසරියකින් හෝ සාරියකින් සැරසිය යුතු අතර ඊට ගැලපෙන පරිදි පාවහන් පැළඳිය යුතුය.

06. මේ සඳහා ගමන් වියදම් / සංයුක්ත දීමනා ගෙවනු නොලැබේ. ආහාරපාන සහ නවාතැන් පහසුකම් ඔබ විසින් සපයා ගත යුතුය.

07. මේ සම්බන්ධයෙන් ඉදිරි දැනුවත් කිරීම් ඇත්නම් මෙම අමාත්‍යාංශීය වෙබ් අඩවියේ පල කිරීම මගින් සහ පත්වීම්ලාභින්ගේ පෞද්ගලික විද්‍යුත් තැපැල වෙත යොමු කිරීම පමණක් සිදු කරනු ලැබේ.

08. වැඩිදුර විමසීම් සඳහා :

- රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය) – දුරකථන අංකය 0112 698268
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - දුරකථන අංකය 0115 980200


එච්.ජේ.ඩී.සී.ජයසේකර
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකථන / ෆැක්ස් : 0112 698268
විද්‍යුත් තැපැල් ලිපිනය : esbpubad@gmail.com


2025 සැප්තැම්බර් මස 23 වන දිනදීය.

**Recruitment to Grade III of the Sri Lanka Engineering Service - Open 2024**

Further to the notification dated 18.09.2025 forwarded to you on the above matter.

02. The formal letter of appointment no. PSC/APP/16/8/10/2024 dated 18.09.2025, issued by the Secretary of the Public Service Commission, has already been sent to you by registered post. (A copy of the specimen letter of appointment is attached.)

03. When attending the induction training on 01.10.2025, you must bring the original documents mentioned in paragraph 19 of the formal letter of appointment under serial numbers ii, iii and iv and a set of photocopies certified by yourself, in addition to the documents mentioned in paragraph 03 of the notification dated 18.09.2025.

04. Details of the induction training programme

- ❖ Duration - Form 1st of October 2025 to 31st of October 2025
- ❖ Induction training
  - Session I - At the Sri Lanka Institute of Development Administration
  - Session II - Institutional field training (At various institutions in Colombo)
- ❖ Attendance on every day that the training programmes are conducted is compulsory.

05. Prescribed attire for the training programme

a) Male officers participating in the training programme should be dressed in national dress or a light-colored long-sleeved shirt and trousers, suitable shoes and a tie.

b) Female officers participating in the training programme should be dressed in a light-colored kandyan saree or saree and matching footwear.

06. No travel expenses or combined allowance will be paid. You must arrange food and accommodation on your own.

07. If there is any further information to be provided in the future in this regard, the appointees will only be notified by publishing such details on the website of this ministry and sending them to their personal email addresses.

08. For further inquiries:

- Ministry of Public Administration, Provincial Councils and Local Government (Sri Lanka Engineering Service Division) - Telephone 0112 698268
- Sri Lanka Institute of Development Administration - Telephone 0115 980200

**Sgd / H.A.D.C. Jayasekara**
Additional Secretary (Public Administration)
For Secretary
Ministry of Public Administration,
Provincial Councils and Local Government

Telephone/ Fax : 0112 698268
Email : esbpubad@gmail.com

23rd September 2025.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/16/8/10/2024
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025 සැප්තැම්බර් මස 18 වැනි දින

(ලියාපදිංචි තැපෑලෙනි)

«නම»
«ලිපිනය_1»
«ලිපිනය_2»
«ලිපිනය_3»
«ලිපිනය_4»

ජා.හැ.අංකය : «ජාහැ_අංකය»

«ආමන්ත්‍රණය»,

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත්කිරීම.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,416 දරන 2024.12.20 දිනැති සහ අංක 2,421 දරන 2025.01.24 දිනැති ගැසට් නිවේදන අනුව 2025.03.15 වන දින පවත්වනු ලැබූ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත හා සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත 2025.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ «කාණ්ඩය» ඉංජිනේරු තනතුරකට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කර ඇති බව සතුටින් දන්වමි. ඒ අනුව, එදින පෙ.ව.8.30 ට පත්වීම භාර ගැනීම සඳහා කොළඹ 07, මලලසේකර මාවත, අංක 28/10 හි පිහිටි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත වාර්තා කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

02. ඔබගේ පත්වීම ක්‍රියාත්මක වනුයේ ඔබ වැඩ භාරගන්නා දිනයේ සිටය. සාධාරණ හේතුවක් නොමැතිව ඉහත සඳහන් පරිදි රාජකාරියට වාර්තා කිරීමට ඔබ අපොහොසත් වුවහොත් මෙම පත්වීම අවලංගු වනු ඇත.

03. ඔබ විසින් මෙම තනතුර ජනතාව වෙනුවෙන් වන භාරයක් ලෙස දරනු ලැබිය යුතුය. එම තනතුරට අදාළ සියලු රාජකාරි හා වගකීම් මෙම දේශයේ හා එහි ජනතාවගේ යහපත වෙනුවෙන් කාර්යක්ෂමව හා අනලස්ව ඉටුකළ යුතු වේ.

04. ඔබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට උපරිම වශයෙන් පක්ෂපාතී විය යුතු අතර අදාළ පරිදි රාජකාරියෙහි රහස්‍යභාවය පූර්ණ වශයෙන් ආරක්ෂා කළ යුතුය.

05. ඔබ රජයේ සේවයේ නියැලී සිටින කාලය තුළ දී වෙනත් ආයතනයක රැකියාවක නියැලීමට හෝ වෙනත් වෘත්තියක නියැලීමට හෝ ඔබට හිමිකමක් නොමැත.

SAMPLE

06. මෙම පත්වීම ස්ථිරය. එතකුදු වුවත් ඔබ වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත් විය යුතු වේ. මෙම පත්වීම් ලිපියෙන් බැඳුණු යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරමින්ද, යහපත් හැසිරීම තුළින්ද, කාර්යක්ෂම ලෙස සේවය කිරීම තුළින්ද ඔබ රජයේ සේවය සඳහා සුදුස්සෙකු බව එම කාලය තුළදී සනාථ කළ යුතු වේ. එසේම පරිවාස කාලය තුළදී ඔබ විසින් සම්පූර්ණ කළ යුතු , ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි සහ මෙම පත්වීම් ලිපියෙහි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සපුරාලීමට ද ඔබ වගබලා ගත යුතුය. මෙම සියළු අවශ්‍යතා යථා පරිදි සපුරාලීමට ඔබ සමත් වුවහොත් පමණක් පරිවාස කාලය අවසානයේදී මෙම පත්වීම ස්ථිර කරනු ලැබේ. එසේ කිරීමට ඔබ අපොහොසත් බව පෙනී යන්නේ නම් එම කාලය තුළදී හෝ එම කාලය අවසානයේදී හෝ මෙම පත්වීම අවසන් කළ හැකි වේ. ඔබගේ පත්වීම ස්ථිර තත්ත්වයට පත් වනුයේ, එම පත්වීම ස්ථිර කළ බවට පත්කිරීම් බලධරයා විසින් විධිමත් ලිපියක් නිකුත් කිරීමෙන් පසුව පමණක් වේ. එතෙක් ඔබගේ පත්වීම ස්ථිර කර නොමැති සේ සැලකේ.

07. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

08. අංක 1836/6 දරන 2013 නොවැම්බර් මස 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදු කර ඇත්තා වූ ද, මතුවට කරනු ලබන්නා වූ ද සංශෝධනයන්ට යටත්ව එම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් ඔබගේ පත්වීම පාලනය වනු ඇත.

09. අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කළ යුතු වේ. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට ඇතුලත් වීමේ භාෂා මාධ්‍ය ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබාගැනීමට ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් සපුරාලන සිව් අවුරුදු පූර්ණකාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාව පවත්වනු ලබන භාෂා මාධ්‍ය සලකනු ලැබේ.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධයෙන් පනවනු ලබන සියළු රීති, රෙගුලාසි, නියෝග හා කාර්ය පටිපාටිවලට අනුගතව ඔබ රාජකාරි වගකීම් හා යුතුකම් ඉටුකල යුතුවේ. එසේම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත්විය යුතුවේ.

11. (අ) අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 82,150 - 10×2,400 - 8×2,940 - 17×3,900 - 195,970 (SL 1 – 2025) වන අතර ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයෙහි උපලේඛන III හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ. ඔබ පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත ඉංජිනේරුවරයෙකු නම් පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත වැටුප් පරිමාණයේ 6 වන වැටුප් පියවරෙහි ඔබ පිහිටුවනු ලැබේ. ඔබ පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත ඉංජිනේරුවරයෙකු නොවන්නේ නම් උක්ත වැටුප් පරිමාණයේ 4 වන පියවර ඉක්මවා යාමට පෙර ද, පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත ඉංජිනේරුවරයෙකු නම් පරිවාස කාලය ඇතුළත ද පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය. මෙම විභාගය 2013 නොවැම්බර් මස 11 වන දිනැති අංක 1836/06 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් විධිවිධාන අනුව පැවැත්වේ.

(ආ) ඔබ පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා ගැනීම සහ එය අඛණ්ඩව පවත්වාගෙන යාම සියලුම ශ්‍රේණිගත උසස්වීම් සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් වේ.

SAMPLE

12. දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් තීරණය කරනු ලැබුවහොත්, එසේ තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් හා එසේ තීරණය කරනු ලබන ආකාරයකින් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇපයක් තැබීමට ඔබ බැඳී සිටියි.

13. සාමාන්‍ය තත්ත්වයන් යටතේ රාජකාරි දිනයන්හි රජය විසින් නියමිත කාලසීමාවන් තුළ ඔබ රාජකාරියෙහි නියැලිය යුතු වුවද, ඔබ දරන තනතුරට අදාළ රාජකාරි වගකීම් අනුව ඕනෑම දිනයක ඕනෑම වේලාවක රාජකාරි ඉටු කිරීමට බැඳී සිටියි.

14. ක්ෂණිකව හෝ කල් දීමක් සහිතව හෝ කරනු ලබන විධිමත් දැන්වීමක් මත සේවය කරන ලෙස ඔබට නියම කෙරෙන දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද, මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ඔබ බැඳී සිටී.

(අ) ඔබ පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත්ය. මේ සඳහා පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීමට ඔබ තාවකාලිකව මුදාහරිනු ඇත. එසේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාවය, කාර්ය මණ්ඩලය යෙදවීමේ අවශ්‍යතාවය සහ වෙනත් අදාළ කරුණු ද අනුව අදාළ පළාත් බලධාරියා සහ පත්කිරීමේ බලධාරියා අතර ඇති කරගනු ලබන එකඟතාවය මතය.

(ආ) සේවයෙන් මුදා හැරීමේ කොන්දේසිවලට යටත්ව පත්වීම් ලිපියක් පළාත් බලධාරියා විසින් ඔබ වෙත නිකුත් කරනු ඇත. අදාළ පළාත් බලධාරියා විසින් ඔබ පළාත තුළ ස්ථාන මාරු කිරීම් කරනු ලැබීමට යටත්වනු ඇත.

(ඇ) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහරිනු ලැබුවද එම කාලය තුළදී ඔබ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට සහ විනය පාලනයට යටත්වනු ඇත.

(ඈ) ඔබ පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහරින ලද කාලය අවසානයේ දී ඔබ නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතුය.

15. දේශයේ ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදවීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් ඔබ යුක්ත බව මෙම පත්වීම භාරගෙන මාස තුනක් ඉකුත්වීමට පෙර විධිමත් වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතුවේ. පොදු 169 හා සෞඛ්‍ය 169 දරන ආකෘති පත්‍ර උපයෝගී කර ගනිමින් රජයේ රෝහලක කාර්යභාර වෛද්‍ය නිලධාරියා මගින් මෙම වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ලබාදීම ඔබගේ වගකීමක් වේ.

16. ඔබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 4 වන හා 7 වන උපලේඛන ප්‍රකාරව ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු වේ. නීතියෙන් නියම කර ඇති පරිදි එම ප්‍රතිඥාව/දිවුරුම ලබාදීමට ඔබ අපොහොසත් වුවහොත්, ඔබ වෙත ලබා දී ඇති මෙම පත්වීම නිරායාසයෙන්ම අහෝසි වේ.

17. මෙම පත්වීම භාරගැනීමට පෙර ඔබ විසින් ඔබගේ අනන්‍යතාව යථා පරිදි තහවුරු කළ යුතුය.

18. පත්වීම භාරගත් වහාම තමන් රාජකාරි සඳහා වාර්තා කළ බව සනාථ කෙරෙන ලිපියක් අනුමත ආකෘති පත්‍රය ප්‍රකාරව ඔබ විසින් ලබාදිය යුතුය. (පරිශිෂ්ට 06)

19. පත්වීම භාරගත් දිනයේදීම පහත සඳහන් ලිපි ලේඛන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත භාරදීමට ක්‍රියා කළ යුතුය.

i. ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත.
ii. උප්පැන්න සහතිකය.
iii. තනතුරට අවශ්‍ය කරන මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන අධ්‍යාපන, වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල මුල් ලේඛන හා ඡායා පිටපත් කට්ටලයක් (පරීක්ෂා කිරීමෙන් අනතුරුව මුල් ලේඛන ආපසු භාරදෙනු ලැබේ)

SAMPLE

iv. විවාහක නම් විවාහ සහතිකය, කලත්‍රයාගේ උප්පැන්න සහතිකය හා දරුවන් සිටී නම් ඔවුන්ගේ උප්පැන්න සහතික.
v. පොදු 160 ආකෘති පත්‍රය ප්‍රකාර සේවා ගිවිසුම.
vi. පොදු 261 ආකෘති පත්‍රය ප්‍රකාර වත්කම් ප්‍රකාශය.
vii. අදාළ වන පරිදි වත්කම් හා බැරකම් ප්‍රකාශය.
viii. ස්ථිර හා තාවකාලික ලිපින.

20. ඔබ මෙම තනතුරෙන් ඉල්ලා අස්වන්නේ නම් දින 30කට පෙර පත්කිරීම් බලධරයා වෙත විධිමත්ව දැනුම් දිය යුතු වේ. පත්කිරීම් බලධරයා එකඟ වන්නේ නම් ඔබගේ මාසික වැටුප හා සමාන මුදලක් රජයට ගෙවීමෙන් මෙම තනතුරෙන් ඉල්ලා අස්වීමට ද ඔබට හැකියාව ඇත.

21. රජයේ සේවයේ මෙම පත්වීම ලබා ගැනීම සඳහා ඔබ විසින් සාවද්‍ය හෝ ව්‍යාජ හෝ තොරතුරු හෝ ලිපිලේඛන හෝ සපයා ඇති බව, ඔබ පත්වීම භාරගත් පසු කුමන අවස්ථාවකදී හෝ තහවුරු වුවහොත්, ඔබගේ පත්වීම ශුන්‍ය හා බලරහිත සේ සලකා, මෙම පත්වීම වහාම නිෂ්ප්‍රභ කරනු ලැබේ. එසේම ඒ වන විටත් ඔබට වැටුප් හා වෙනත් දීමනා ලෙස රජය / පළාත් සභාව විසින් ගෙවා ඇති සියළු මුදල් ඔබෙන් ආපසු අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

22. මෙම ලිපිය ලැබුණු බවත්, මෙහි දැක්වෙන කොන්දේසිවලට යටත්ව, මෙම පත්වීම ඔබ විසින් භාරගන්නේ ද යන බවත්, අදාළ ආකෘති පත්‍රය සම්පූර්ණ කර රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දන්වා යවනු මැනවි.

23. උක්ත 22 වන වගන්තිය ප්‍රකාරව ඔබ පත්වීම භාර ගන්නා බවට පත්වීම ක්‍රියාත්මක වන දින සිට දින 14ක් ඇතුළත රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් නොදුනහොත් ඔබගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

මෙයට විශ්වාසී,

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් :
1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
3. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
4. පෞද්ගලික ලිපිගොනුවට

SAMPLE